

# "ඔන්න හාවා ඇඟිලි කනෝ..."

23 වන සෙනසුරාදා ජයලත් මනෝරත්න නම් සුවිශේෂී කලා ශිල්පියාගේ ගීත සැන්දෑවකට සහභාගිවන්නට අපි වාසනාවන්ත වූයෙමු. පැමිණ සිටි රසිකයන් රස ගන්වමින් පැය තුනක පමණ කාලයක් විනෝදාත්මක මෙන්ම හරවත් සැන්දෑවක් ඉදිරිපත් කිරීමට ඔහු සමත් විය. හානුක මනෝරත්න ගේ මෙහෙයුමෙන් චන්දිම ජයතිලක තිසර බණ්ඩාර හා මිලින්ද රූපසිංහ මැවූ සංගීතයද අපූරු ය.

ජයලත් මනෝරත්න යනු සුවිශේෂී දක්ෂතා සපිරි පරිපූර්ණ කලා ශිල්පියෙකි. ඔහු නිකම්ම නිකම් නලුවකු නොවේ. රංගනයට සහ ගායනයටද හපනෙකි. නාට්‍ය නිෂ්පාදක වරයෙකි අධ්‍යක්ෂවරයෙකි ලත් කතුවරයෙකි විචාරකයෙකි. මෙලෙසින් ඔහුගේ ගිණුමට තවත් හැකියාවන් විශාල ප්‍රමාණයක් බැර කළ හැකි ය. බොහෝ නලුවෝ කැමරාව නැවතුණ පසුවද නලුවකු ලෙසම හැසිරෙති. නමුත් මනෝ එසේ නොවේ. කැමරාව නැති තැන ඔහු සරළ නිහතමානී මිනිසෙකි. ඒ මම දකින තවත් සුවිශේෂී කාරණයකි.

ජයලත් මනොරත්නයන්ගේ නාට්‍යයක සුලු චරිතයක් රඟපෑමට මම වසර ගණනාවක් පෙරුම් පිරුවෙමි. කෙසේ හෝ මට ඒ අවස්තාව උදා කර ගැනීමට හැකි විය. අන්දරේලා නමැති දුවැන්ත නිර්මාණයට සහභාගිවන්නට මට ඉඩ ලැබීම මට නාට්‍ය කලා පිළිබඳ විශාල දැනුම් සම්භාරයක් ලබා ගන්නට ඉඩ දුන් විශ්ව විද්‍යාලයකට ඇතුල් වන්නට ඉඩ ලැබුණා සේ ය.

මගේ රංගන දිවියට අවුරුදු 25ක් සපිරෙයි. සන්නස පුවත්පතට පම්බන්ධ වූ දා සිට විවිධ පුද්ගලයන් වේදිකාවේ රස මුසු තැන් ලිපියක් ලෙස ලියන ලෙස මගෙන් ඉල්ලා සිටි වාර ගණන අපමණ ය. මේ සඳහා සුදුසු කාලය එන කෙත් බලා සිටින අතර ඒයට සුදුසු ප්‍රවිශ්ඨය එදා මනෝ අයියාගේ ප්‍රසංගයේදී මට ලැබුණි.

ඔහු එදා කියූ කතා කීපයක් අද අපි කියවමු.

අපේ නාට්‍ය ඉතිහාසයේ ටීටර් යුගයට ඇත්තේ විශාල වටිනා කමක්. මේ යුගයේ බිහිවුණ ටීටර් රස කතා රැසක තෝතැන්නක්. ටීටරයක් නටන විට ටීටරයෙන් කියවෙන කතාවට අදාල පරිසරය ඒ ආකරයෙන්ම වේදිකාව මත මැවීමට ටීටර්කරුවා උත්සාහ ගන්නවා. උදාහරණයක් ලෙස රජ මාළිගාවක දර්ශණයක් නම් මාළිගාවේ විසල් කුළුණු සිට අනෙකුත් සියලුම අංගෝපංග වේදිකාව මත ජීවමාන කරන්නට ඔහු ට සිදුවෙනවා. ඊළඟ දර්ශණය කැලයක් නම් ඒ කැලයේ ගහකොළ පමණක් නොව සතුන් පවා වේදිකාව මත මවන්නට ඔහුට සිදුවෙනවා. එසේ නොකළොත් විරුද්ධ ටීටර් කාරයන් කැලෑපත්තර ගහන නිසා තමයි මේ තරම් මහන්සියක් ගන්න වුණේ. කැලෑ පත්තර කියන්නෙ අපහාසාත්මක කරුණු ඇතුලත් නිර්නාමික ලියවිල්ලකටයි. ලියන්නා සිය නමින්ම වගකීම බාරගෙන ලියන ලියවිල්ලක් කැලෑපත්තරයක් නොවෙයි.

ඉතින් එක දවසක් ටවර් රඟහලේ අංගුලිමාල කතාව ඇතුලත් ටීටර් එකක් රඟ දැක්කුවා. වේදාකාව උඩ කැලයක් නිර්මාණය වෙලා. හාවෝ මුවෝ වගේ සත්තුත් ඇවිද ඇවිද ඉන්නවා. ඔන්න අංගුලිමාල දුවගෙන එනවා. ඇඟිලි මාලයකුත් බෙල්ල වටේ දාගෙන. ඇවිත් තමන්ගෙ අහිංසක කම පෙන්නන් හාවෙක් අතට ගන්නවා. අරගෙන පපුවට තුරුළුකරගෙන ගීතයක් ගායනා කරනවා.

එක පාරටම ප්‍රේක්ෂකාගාරය පැත්තෙන් පොඩි කසු කුසුවක් ඇහෙනවා. නලුවා හිතනවා ඔහුගේ රංගනයේ හොඳ කම නිසා තමයි මේ කියලා තව තවත් හාවාව තුරුළු කරගෙන රංගනයේ යෙදෙනවා.

කසු කුසුව හූ හඬක් වෙනවා. ඒ එක්කම ප්‍රේක්ෂකයෙන් නැගිටලා කෑ ගහනවා.

"ඔන්න හාවා ඇඟිලි කනෝ..."

එතකොට තමයි නලුවට දෙලෝ රත් වුණේ. ඇත්ත ඇති හැටියෙන් පෙන්නන්න ඇඟි හැටියට අරගෙන තිබුණේ පාට කරපු කැරට් අල. පපුවට තුරුල් වෙලා ඉන්න ගමන් අර හාවා හෙමින් සැරේ කැරට් කන්න පටන් අරගෙන. පාට ගෑවත් හාවා කැරට් අඳුනනවනෙ.

**ඊළඟ කතාව මනෝ අයියටම වෙච්ච සිද්ධියක් මනෝ අයියාගේම වචන වලින්.**

කලින් දිනයේ ඈත ප්‍රදේශයක වේදිකා නාට්‍යයක් රඟ දැක්වීමට ගොස් මනෝ අයියා ගෙදර ආවේ පාන්දර 4ට විතර. ඒ වෙනකොට ඇඟේ තියෙන මහන්සිය ගැන ආයෙම කියන්න දෙයක් නැහැනෙ. මනෝ අයියා යන්තම් ඇහැ පියවගන්න හැදුවා විතරයි වෑන් එකක් ඇවිත් ගේ දොරකඩ නතර කෙරුවා. ඒ වාහනය ඇවිත් තිබුණේ මනෝ අයියව ටෙලි නාට්‍යයකට එක්ක යන්න. ඔහොම තමයි කාර්ය බහුල නලුවන්ගෙ ජීවිතේ. මහන්සියෙන් සිටි මනෝ අයියා ඔහුට එක්ක යන්න පැමිණ සිටි සහය අධ්‍යක්ෂවරයාගෙන් ඇහුවා "මල්ලි.. මගේ ෂූටිං උදේම තියෙනවද..?" කියලා.

"මනෝ අයියගෙ ෂූටිං නම් උදේම නැහැ.. අයියගෙ ෂූටිං තියෙන්නෙ දවල් වෙලා.. හැබැයි ඒ වෙලාවට ගන්න වාහනයක් නෑ.. ඒකයි අපි උදෙන්ම ආවේ අයියව අරගෙන යන්න.."

"මට පොඩ්ඩක් නිදාගන්න ඕනෙ මල්ලි.. වාහනයක් නැතුවට කමක් නෑ.. මං පාරෙ බස් එකේ එන්නං.. කොහෙද ෂෞටිං තියෙන්නෙ මල්ලි..?"

"පිටකොටුවට ඇවිල්ලා අයියේ 224 බියගම පාරේ පූගොඩ බස් එකට නගින්න. කැළනිය පහු වෙලා ටිකක් දුර යනකොට නෙලුම් උළු කියලා උළු මෝලක් තියෙනවා. එතනින් බැහැලා නෙලුම උලු පොරණුව ඉස්සරහා තියෙන බොරලු පාරේ තමයි ෂූටිං තියෙන්න..




අයියට හොයා ගන්න අමාරු වෙන එකක් නැහැ.."

දවල් දොළහට ඒ කිව්ව විදිහට මනෝ අයියා පිටකොටුවට ඇවිත් බියගම පාරේ බස් එකකට නැගලා කොන්දොස්තර මල්ලට මෙහෙම කිව්වා.

"මල්ලි.. මාව නෙලුම උළු ළඟින් බස්සනවද?"

කොන්දොස්තර මල්ලි "හරි හරි අයියා.. මං බස්සන්නංකො අයියව නියම ප්ලේස ඒකෙන්" යි කියලා බොහොම ගෞරවයෙන් වැඩේ බාර ගත්තා

කලින් දිනේ තිබුණ මහන්සියටත් එක්ක මනෝ අයියට සීට් ඒකේම හොඳටම නින්ද ගියා. එක වෙලාවක ඇස් ඇරලා වට පිට බලද්දි මනෝ අයියට තේරුණා ෂූටිං කරන තැන පහුවෙලා කියලා. මනෝ අයියා නිකමට වගේ කොන්දොස්තර මල්ලිගෙන් ඇහුවා.

"මල්ලි. නෙලුම උළු පහුඋණා වගේ නේද?" කියලා.

කොන්දොස්තර මල්ලිගෙ ඇස් උඩ ගියා. ඔලුව පොඩ්ඩක් කැසුවා. ඒත් මිනිහා කිසිම අතපසුවීමක් නොවුණ ගානට ඇඟට පතට නොදැනී මනෝ ට මෙහෙම කිව්වා.

"අයියේ.. ඔය නෙලුම උලු තියෙනවා නේද.. ඒ උලු හරිම සවුත්තුයි.. ඉස්සරහ තියෙනවා විජය උලු කියලා පොට් එකක්.. මම එතනින් අයියව බස්සන්නම්කො.. එතන බඩු හොඳයි.."




